## 162 – දයා ප්‍රේමය ඇති තැන

දයා ප්‍රේමය ඇති තැන
දෙවියෝ වැඩ වසනු ඇත

ක්‍රිස්තුස් තුමන්ගේ ප්‍රේමයෙන් අපි හැම දෙන එක්වෙමු
එතුමන් තුළ ප්‍රීතියෙන් සතුටු වෙන්නෙමු
ජීවමාන දෙවිතුමනට හද බැති පෙම් දක්වමු
අවංකවූ හෘදයෙන් එකිනෙකාට ප්‍රේම කරමු

අපි කිසියම් තැනකට එක් රැස් වී සිටිමු ද
එක්සිත් වී සිටිනට ප්‍රවේසම් වෙමු
සණ්ඩු දබර නඩු හබ නොව සාමයෙන් ජීවත් වෙමු
කිතු සමිඳාණන් නිතින් අප වෙතටම කැඳවා ගනිමු

මොක් වැසියන් සමගින ඔබ තේජස දකිනට
කිතු සමිඳුනි අප හට වරය ලැබේවා
තවද කිසිදු අඩුවක් නැති සදා සැපත අප ලැබ
සතත කල්හි සගසැප මොක් පුරයේ අපි වඳිමුව